....................................පලාතේ..........................දිස්ත්‍රික්කයේ
....................................................................................
..මහා වාරිමාර්ග ව්‍යාපාරයේ........................................යායේ
(බෙදුම් ඇළ අංක............................................/කෙත් ඇළ අංක
FC.....................................සිට FC...........................දක්වා
අයත්) ....................................................බෙදුම් ඇළ/උත්සාන
ගොවි සංවිධානයේ

# <u>අතුරු ව්‍යවස්ථාව</u>

(1) **ගොවි සංවිධානයේ නම**:–..................................................

මින් පසුව මෙම අතුරු ව්‍යවස්ථාවේ මෙම නාමය බෙදුම් ඇළ ගොවි සංවිධානය යන කෙටි නාමයෙන් හඳුන්වනු ලැබේ.

(2) **ලිපිනය**:–.......................................................................
.......................................................................
.......................................................................

21 ගොවි සංවිධානයේ කාර්යාලීය ලිපිනය සාමාන්‍ය ලිපිනය ලෙස සලකනු ලබන අතර ස්ථිර කාර්යාලයක් නොමැති අවස්ථාවල දී සංවිධානයේ ලේකම් වරයා ගේ පෞද්ගලික ලිපිනය සංවිධානයේ ලිපිනය වන්නේ ය.

22 බෙදුම් ඇළ ගොවි සංවිධානයේ ලිපිනය වෙනස් වුවහොත් ඒ බව එම වෙනස්වීම සිදුවී දින 14 ක් ඇතුළත ගොවි ජන සංවර්ධන කොමසාරිස් ජෙනරාල් වරයා ට සහ ගොවි සංවිධානය සමග එකතු වී කටයුතු කරන සියළුම ආයතන වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

23 ලිපිනය වෙනස්වීම අතුරු ව්‍යවස්ථාව සංශෝධනයක් ලෙස නොසැලකිය යුතු වේ.

(3) **ගොවි සංවිධානයේ බල ප්‍රදේශය**:–.......................................
.......................................................................
.......................................................................
.......................................................................
.......................................................................

(4) **ගොවි සංවිධානයේ පරමාර්ථ**

41 **මූලික පරමාර්ථ**:–

411 බල ප්‍රදේශයේ ගොවීන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම වෙනුවෙන් පෙනී සිටීම , ගොවීන් නියෝජනය කිරීම හා ගොවීන්ට තනිවම ඉටුකර ගත නොහැකි කාර්යයන් ඉටුකර දීම සඳහා මැදිහත් වීම

412 2000 අංක 46 දරණ ගොවි ජන සංවර්ධන පනතින් සහ 1968 අංක 48 දරණ සංශෝධන වාරිමාර්ග ආඥා පනතින් හා 1994 අංක 13 දරණ සංශෝධිත වාරිමාර්ග ආඥා පනතින් ගොවි සංවිධානය වෙත පැවරි ඇති බලතල ක්‍රියාත්මක කිරීම

413 ජලය කාර්යක්ෂම ලෙස බෙදා ගැනීමට හා වාරි පද්ධතිය මනාව නඩත්තු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා අවශ්‍ය අවස්ථාවල දී වාරිමාර්ග පුනරුත්ථාපන කටයුතු වල නිරත වීම

414 කෘෂි නිෂ්පාදන ඵලදායිතාව ඉහල නැංවීම සඳහා අවශ්‍ය යෙදවුම් හා සේවාවන් සැපයීමේ කටයුතු පහසු කරවීම

415 ප්‍රදේශයේ පවතින කෘෂිකාර්මික සම්පත් හා නිෂ්පාදන කටයුතු පිළිබඳ දත්ත හා තොරතුරු එකතු කිරීම හා ඒවා අවශ්‍ය ආයතන වෙත ලබා දීම

416 ගොවීන් අතර මෙන්ම ගොවීන් හා රජය අතර සහ පෞද්ගලික අංශය අතර සංනිවේදන කටයුතු පහසු කරවීම

417 ප්‍රතිලාභී සහභාගීත්වය ඇතුව බල ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු සැළසුම් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහය ලබා දීම

418 පෞද්ගලික අංශයේ තරගකාරිත්වයට ඉඩ දෙමින් කෘෂි නිෂ්පාදන සඳහා හොඳ මිලක් ලබා දීම

419 රාජ්‍ය හා පෞද්ගලික අංශය මගින් කෘෂි නිෂ්පාදන ක්‍රියාවලිය පහසු කරවීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන් ගොවීන් වෙත ගෙන යෑම සඳහා අවශ්‍ය සහාය ලබා දීම

4110 දැනුවත් කිරීම සහ කුසලතා සංවර්ධනය තුලින් ගොවි ජනතාව බල ගැන්වීමට අවශ්‍ය කටයුතු කිරීම

4111 සාමාජිකයින්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමට අවශ්‍ය සහාය ලබා දීම සඳහා කටයුතු කිරීම

**42 ද්විතීය පරමාර්ථ**

421 පොදු සම්පත් සමානාත්මතාවකින් යුක්තව පරිභෝජනය කිරීම සඳහා ප්‍රතිලාභීන් යොමු කරවීම

422 කෘෂිකාර්මික ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා නව තාක්ෂණය ගොවීන් වෙත ගෙන යෑම සඳහා අවශ්‍ය සහාය ලබා දීම

423 වෙළඳපොළ අවශ්‍යතාවන් අනුව නිෂ්පාදන කටයුතු කිරීම සඳහා ගොවීන් යොමු කරවීම

424 පරිසර සංරක්ෂණයට ඉඩ දෙමින් ප්‍රදේශයේ පවතින සම්පත් මනා කළමනාකරණයකින් යුත්තව ප්‍රයෝජනයට ගැනීම සඳහා අවශ්‍ය මැදිහත්වීම සහ සහාය ලබා දීම

425 ඉතිරි කිරීම සඳහා සාමාජිකයින් යොමු කරවීම සහ පහසු ණය වැඩ සටහන් හඳුන්වා දීමට සහාය වීම

**43 ඉහත පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාව අනුව පහත සඳහන් බලතල ගොවි සංවිධානයට ඇත්තේය**

431 ගොවි සංවිධානය සඳහා අරමුදල් පරිත්‍යාග සහ දායක මුදල් දඩ මුදල් අය කිරීම , එකතු කිරීම සහ ඒවා භාර ගැනීම

432 ගොවි සංවිධානයේ උන්නතිය සඳහා බැංකුවක හෝ ඊට සමාන ආයතනයක ඉතිරි කිරීමේ ගිණුම්, ජංගම ගිණුම් හෝ වෙනත් ඕනෑම වර්ගයක ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යෑම (2000 අංක 46 දරණ ගොවි ජන සංවර්ධන පනතේ 44 (2) අනුව)

433 පුද්ගලයින් හෝ සංස්ථාපිත ආයතන සමග ගොවි සංවිධානයේ උන්නතිය සඳහා ගිවිසුම් වලට එළඹීම

434 ගොවි සංවිධානයේ උන්නතිය සඳහා ඔනෑම නිශ්චල හෝ චංචල දේපලක් නැතහොත් අයිතිවාසිකමක්, වරප්‍රසාදයක් පවරා ගැනීම, මිලට ගැනීම, බද්ධට ගැනීම ,හුවමාරු කර ගැනීම හෝ කුලියට ගැනීම

435 ගොවි සංවිධානයේ මුදල් සංවිධානය විසින් ඵලදායී යැයි තීරණය කරන ඕනෑම ව්‍යාපාරයක බැංකුවක හෝ වෙනත් ආයතනයක ආයෝජනය කිරීම

436 ගොවි සංවිධානයේ දියුණුව සඳහා ඕනෑම මුදලක් ණයට ගැනීමට ද ඒ සම්බන්ධයෙන් උගසක්, ණයකරයක් බැඳීමක් හෝ ඕනෑම දේපලක් ඇප වශයෙන් හෝ වගකීමක් වශයෙන් තැබීම

437 සාමාජිකයින්ගේ පොදු ආර්ථික සාමාජීය අවශ්‍යතා සපුරාලීම සඳහා ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යෑම

438 සාමාජිකයින් සඳහා පමණක් සීමා වූ ණය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

439 ගොවි සංවිධානයේ දියුණුව සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග එකතු වී විවිධ සංවර්ධන හා සංස්කෘතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

4310 සාමාජිකයින්ගේ උන්නතිය සඳහා ඔවුන් දැනුවත් කිරීම තාක්ෂණය ලබා දීම අවශ්‍ය යෙදවුම් හා සේවා ලබා දීමට කටයුතු කිරීම

4311 ගොවි සංවිධානයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා විවිධ කමිටු පත් කර ගැනීම

4312 වාරි ජලය උපරිම කාර්යක්ෂමතාවකින් යුක්තව සියළුම ගොවීන්ට ලබා දීම සඳහා සාමාජිකයින්ගේ එකගතාව මත ජල මුර ක්‍රමයක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම

4313 ගොවි සංවිධාන බල ප්‍රදේශයේ වාරි පද්ධතියේ නඩත්තු කටයුතු කාර්යක්ෂම ලෙස සිදු කිරීම සඳහා නඩත්තු වැඩ සටහන් සැකසීම හා ගොවි සහභාගීත්වය හා දායකත්වය ඇතුව එම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම

4314 වාරි පද්ධතියට සිදු වන ස්වාභාවික හානි සහ පුද්ගලයින් විසින් සිදු කරන හානි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූලව වැලැක්වීම සඳහා මැදිහත් වීම සහ ඒ සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කිරීම

4315 ගොවි සංවිධාන බල ප්‍රදේශය තුළ ජල සම්පාදනය සහ ඉඩම් වගා කිරීමට අදාල සියළු කටයුතු හා ඒවාට සම්බන්ධ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා වාරිමාර්ග නඩත්තු කටයුතුවල නියැලීමට සහ වාරිමාර්ග ආඥා පනත යටතේ බලපාන නීති හෝ රෙගුලාසි හෝ වාරිමාර්ග හෝ වගාවට සම්බන්ධ ස්ථාපිත සිරිත් විරිත් කඩවන පරිදි කටයුතු කිරීම හෝ අවශ්‍ය පරිදි කටයුතු නොකිරීම නිසා කට්ටි කරුවන් ට අද ගොවීන්ට හෝ ඉඩම් හිමියන්ට සිදු විය හැකි හානියක් වැලැක්වීම ට කටයුතු කිරීමට 1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන)

පනතේ 23 වන වගන්තිය යටතේ ගොවි සංවිධානයට බලය ඇත.

4316 වාරි කලමනාකරණයට අදාල නීති රීති සැකසීමේ බලය 1968 අංක 48: දරණ වාරිමාර්ග ( සංශෝධන) ආඥා පනතේ 11 (1)වගන්තිය යටතේ ගොවි සංවිධානයට ලැබී ඇත.

4317 වාරි කලමනාකරණයට අදාලව සකස් කරනු ලැබූ නීති රීති නොපිළිපැදීම හෝ එම නීති උල්ලංගනය කිරීම වැලැක්වීමට සහ එවැනි හේතුවක් නිසා ගොවීන්ට සිදුවන හානි වැලැක්වීම ට මැදිහත් වීමට 1968 අංක 48 වාරිමාර්ග (සංශෝධන) ආඥා පනතේ 23 (2) වගන්තිය යටතේ ගොවි සංවිධානයට බලය ඇත.

4318 නීතියක් හෝ රෙගුලාසියක් මගින් ගොවි සංවිධාන වෙත පැවරී ඇති නීත්‍යානුකූල රාජකාරියක් ඉටු කිරීමේ දී නීතිමය හේතුවක් නොමැතිව එය කිරීමට ඉඩ නොදීමත් , හිංසා කිරීමත් ,අවහිර කිරීමත් සිදු කල ඕනෑම පුද්ගලයෙකුට විරුද්ධව අධිකරණයේ පිහිට පැතීමට 1968 අංක 48 දරණ වාරිමාර්ග (සංශෝධන) ආඥා පනතේ 95 වගන්තිය අනුව ගොවි සංවිධානයට බලය ඇත.

4319 තම බල ප්‍රදේශය තුල වාරි කර්මාන්ත සහ ජල කලමනාකරණය කිරීමට අදාලව 2000 අංක 46 දරණ ගොවි ජන සංවර්ධන පනතේ අංක 81, 82, 83, 84 85 , 86 , 87 වගන්ති යටතේ ගොවි සංවිධානය වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම

4320 බල ප්‍රදේශයේ සම්පත් උපයෝගී කර ගෙන නීත්‍යානුකූල සංවර්ධන වැඩ සටහන් ආරම්භ කිරීමට සහ ඒ සඳහා අදාල ආයතන සම්බන්ධ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම

4321 සංවිධානයේ අවශ්‍යතාවයන් මත කාර්ය මණ්ඩල බඳවා ගැනීම පත් කිරීම සහ ඉවත් කිරීම

4322 සෑම වගා කන්නයකම පවත්වනු ලබන කන්න රැස්වීමේ දී තීරණය කරනු ලබන මුදලක් සංවර්ධන අරමුදල ලෙස ගොවීන්ගෙන් අයකර ගැනීමට ගොවි සංවිධානයට බලය ඇත්තේය

## 05. ගොවි සංවිධානයේ සාමාජිකත්වය

මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූලව සංවිධානයේ සාමාජිකත්වය පහත පරිදි වේ.

- මෙම අතුරු ව්‍යවස්ථාවේ 51 යටතේ සඳහන් සුදුසුකම් ඇතුව සංවිධානය ලියා පදිංචි කරන අවස්ථාවේ එම අයදුම්පතේ අත්සන් කර ඇති අය සහ සංවිධානයේ සාමාජික නාම ලේඛනයේ නම් සඳහන් පුද්ගලයන්
- මෙම අතුරු ව්‍යවස්ථාව අනුව නිසි පරිදි සාමාජිකත්වය ලබා ගත් සෑම පුද්ගලයෙකු ම
- ගොවි සංවිධානයේ සාමාජිකත්වය දෙයාකාර වේ.

1. පූර්ණ සාමාජිකත්වය
11. ආශ්‍රිත සාමාජිකත්වය

- ගොවි සංවිධානයේ අවම සාමාජික සංඛ්‍යාව 25 ක් විය යුතු අතර උපරිමය පිළිබඳ සීමාවක් නොමැත.

### <u>51 සාමාජිකත්වය සඳහා සුදුසුකම්</u>

### <u>511පූර්ණ සාමාජිකත්වය</u>

කෘෂිකර්මාන්තය තම ජීවිකාව කරගත් සෑම තැනැත්තෙකුම තමා

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නම්

(ආ) වයස අවුරුදු දහසයට නො අඩු නම් සහ

(ඇ) තමා සාමාජිකත්වය අපේක්ෂා කරන ගොවි සංවිධාන බල ප්‍රදේශයේ පදිංචි වී ඇත්නම් හෝ අවුරුදු දෙකකට වැඩි කාල පරිච්ඡේදයක් ඒ බල ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතුවල නිරතව සිටියේ නම් ගොවි සංවිධානයේ පූර්ණ සාමාජිකත්වය සඳහා සුදුස්සකු වේ

- පූර්ණ සාමාජිකයින් හට ගොවි සංවිධානයේ ඡන්ද බලය හිමි වේ

### <u>512 ආශ්‍රිත සාමාජිකත්වය</u>

(අ) තම ප්‍රධාන ජීවිකාව කෘෂිකර්මය නොවන්නා වූ ද ගොවි සංවිධානයක බල ප්‍රදේශය ඇතුලත කෘෂිකාර්මික ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු

නැතහොත්

(ආ) කෘෂිකර්මයට අදාල යම් නිෂ්පාදනයක හෝ කෘෂිකාර්මික නිෂ්පාදන හෝ භාණ්ඩ අලෙවි යෙහි නිරත වූ යම් තැනැත්තකු ට ආශ්‍රිත සාමාජිකත්වය ලබා දෙනු ලැබේ.

- ආශ්‍රිත සාමාජිකයින් හට ඡන්ද බලය හිමි නොවන අතර ගොවි සංවිධානයේ කාරක සභිකයෙකු හෝ නිලධාරියෙකු වශයෙන් කටයුතු කළ නොහැක. එහෙත් මහා සභා රැස්වීම්වලට පැමිණ තම අදහස් හා යෝජනා ඉදිරිපත් කළ හැක.

## 52 සාමාජික ගාස්තුව

සෑම සාමාජිකයෙකු ම රුපියල් ...................................... ක මාසික සාමාජික ගාස්තුවක් ගෙවිය යුතු අතර එය මාසිකව හෝ අර්ධ වාර්ෂිකව ගෙවිය හැක. සාමාජික ගාස්තු අයකරන ආකාරය මහා සභාව විසින් තීරණය කළ යුතු අතර ගෙවන ආකාරය මහා සභාවට දැනුම් දිය යුතු අතර ඒ අනුව අඛණ්ඩව වාර තුනකට වඩා වැඩි කාලයක් සාමාජික ගාස්තු නොගෙවන අයට මහා සභා රැස්වීම්වල කතා කිරීමට, ඡන්ද විමසීම්වල දී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම නොලැබේ.

## 53 සාමාජිකයින්ගේ අයිතිවාසිකම් යුතුකම් හා වගකීම්

53.1 මෙම අතුරු ව්‍යවස්ථාවේ අංක 51 යටතේ ඇතුලත් කර ගන්නා සියළු සාමාජිකයින් ට මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සියළුම අයිතිවාසිකම් යුතුකම් හා වගකීම් පැවරෙනු ඇත.

53.2 ගොවි ජන සංවර්ධන පනත සහ වාරිමාර්ග ආඥා පනත යටතේ වාරිමාර්ග ජල කළමනාකරණය ට අදාල ව පනවා ඇති නීති රීති වලට ගරු කිරීම සහ ඒවා පිළිපැදීම සංවිධානයේ කාරක නියෝග වල අඩංගු කොන්දේසි පිළිපැදීම සහ ක්‍රියාත්මක කිරීම

53.3 සංවිධානයේ අරමුදල් සහ දායක මුදල් නොකඩවා ලබා දීම

53.4 ජලය සඳහා අනෙකුත් සාමාජිකයින්ගේ හිමි කමට ගරු කිරීම සහ අදාල නීති රීති හා සම්ප්‍රදායන් පිළිපැදීම

53.5 ජලය බෙදා හැරීම, වාරි පද්ධතියේ නඩත්තුව සහ වගා සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී ගොවි සංවිධානයේ තීරණ අනුව කටයුතු කිරීම සහ අවශ්‍ය දායකත්වය ලබා දීම

53.6 ඉඩම් හිමි වගා කරුවෙකු හෝ අඳ ගොවි සාමාජිකයෙකු තම ඉඩම වගා කිරීම සඳහා වෙනත් අයෙකුට පවරන්නේ නම් සෑම වගා කන්නයක් ආරම්භ වීමට පෙර ඒ බව ගොවි සංවිධානයට ලිඛිතව දැනුම් දිය යුතුය

## 54 වෙනුවට නම් කල හැකි තැනැත්තන්

සෑම සාමාජිකයෙකුටම තමා වෙනුවෙන් ගොවි සංවිධානයේ කටයුතු වලට සහභාගී වීම සඳහා වෙනත් පුද්ගලයෙකු නම් කළ හැක. මොහුට සාමාජිකයා වෙනුවෙන් රැස්වීම් වලට සහභාගී වී කතා කිරීමට හා ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතියක් ඇත. සෑම සාමාජිකයෙකුට ම තමා වෙනුවෙන් ඉදිරිපත් කරන/නම් කරන තැනැත්තාගේ නම ලිපිනය සාමාජිකයා ට ඇති සම්බන්ධතාවය හා ඔහු විසින් ගන්නා තීරණ වලට එකග වන බවට තම සුපුරුදු අත්සන සහිත ලිපියකින් මහා සභා රැස්වීම පැවැත්වීමට පැය 24 කට පෙර ගොවි සංවිධානයේ ලේකම් වරයාට ලිඛිතව දැනුම් දිය යුතුවේ.

## 55 සාමාජිකත්වය අහෝසි විම

55.1 සාමාජිකයා මිය ගිය විට

55.2 සාමාජික මුදල් අඛණ්ඩව වාර 3 ක කාලයක් නොගෙවා තිබීම

55.3 උමතු හෝ සිහිවිකල් බව නීත්‍යානුකූල ව පිළිගැනීම

55.4 බංකොලොත් භාවයට පත් වීම

55.5 කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය නොවීම නිසා පූර්ණ සාමාජිකයින් ආශ්‍රිත සාමාජිකයින් බවට පත් වීම.

55.6 මසකට කලින් දැනුම් දී සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වීම

## 56 සාමාජිකත්වය අත්හිටුවීම

56.1 සාමාජික මුදල් වාර 3 කට වඩා වැඩි කාලයක් නොගෙවා සිටීම

56.2 සාධාරණ හේතුවක් නොමැතිව නොදන්වා අඛණ්ඩව මහා සභා රැස්වීම් තුනකට සහභාගි නොවීම

56.3 ගොවි සංවිධානයෙන් ලබාගත් ණය මුදල් ගෙවීම පැහැර හැරීම

56.4 ගොවි සංවිධානයට ගෙවිය යුතු දඩ මුදල් ගෙවීම පැහැර හැරීම

56.5 ගොවි සංවිධානයෙන් ලබා ගත් අත්තිකාරම් මුදල් නියමිත කාලය තුළ නිරවුල් කිරීම පැහැර හැරීම

56.6 ගොවි සංවිධානයේ මුදල් අවභාවිතා කර ඇති බව සනාථ වීම

56.7 ගොවි සංවිධානය සතු අත ඉතිරිය/පොත්පත් /බඩු බාහිරාදිය/ සාධාරණ හේතු දැක්වීමකින් තොරව භාර නොදී සිටීම

## 57 සාමාජිකත්වය අවලංගු කිරීම හා සාමාජිකත්වයෙන් නෙරපා දැමීම

571 යම් කිසි සාමාජිකයෙකු මෙම අතුරු ව්‍යවස්ථාව කඩකලහොත් හෝ සංවිධානයේ කාරක නියෝග කඩකලහොත් හෝ සාධාරණ හේතුවක් නොමැතිව නොකඩවා මහා සභා රැස්වීම් 3 කට නො පැමිණිය හොත් ඔහුගේ සාමාජිකත්වය කාරක සභාව විසින් තහනම් කර ඒ බව මහා සභාවට දැන්විය යුතුය. එවැනි අවස්ථාවල එම සාමාජිකයින්ගේ සාමාජිකත්වය අවලංගු කිරීම මහා සභා තීරණයක් මත කල යුතුය.

572 තවද, යම් සාමාජිකයෙකු සංවිධානයේ කටයුතු වලට හා ප්‍රතිපත්තිවලට හානි වන පරිදි හෝ බාධාවන පරිදි කටයුතු කලහොත් එසේම සංවිධානයේ ගරුත්වය ට හානි වන අයුරින් කටයුතු කල හොත් ඉහත (1) පරිදි ම එම සාමාජිකයා සංවිධානයෙන් නෙරපා දැමිය හැකිය. එවැනි නෙරපා දැමීම ද මහා සභාවකින් සම්මත කළ යුතු වේ.

573 යම් සාමාජිකයෙකුගේ සාමාජිකත්වය තහනම් කර තිබෙන කාලය තුළ දි එම සාමාජිකයා සාමාජිකත්වයෙන් නෙරපීම ගැන සාකච්ජා කරන මහා සභාවට පැමිණ ඒ ගැන අදහස් දැක්වීමට හා ඡන්දය පාවිච්චි කිරීමට ඔහුට බලය ඇත. එහෙත් ඒ අතර සාමාජිකයෙකුට හිමි අනිකුත් කිසිම බලයක් සාමාජිකත්වය තහනම් කර තිබෙන කාලය තුළදී ඔහුට පාවිච්චි කළ නොහැක.

## 6 කෙත් ඇල කණ්ඩායම

නිශ්චිතව හදුනාගත් කෙත් ඇලක් , කෙත් ඇල කිහිපයක් තුළ හෝ කෙත් ඇලක කොටසක වාරි ජලය ලබා ගෙන වගා කරන ගොවි කණ්ඩායම කෙත් ඇල කණ්ඩායම වේ. දළ වශයෙන් මෙම කණ්ඩායම 30 කට වැඩි නොවිය යුතුය.

## 61 කෙත් ඇල කණ්ඩායමේ සංයුතිය

නිශ්චිතව හදුනාගත් කෙත් ඇලක/කෙත් ඇල කිහිපයක හෝ කෙත් ඇල කොටසක වගා කරන සියUම ඉඩම් හිමි වගා කරුවන් , වගාකරුවන් හා අඳගොවින්ගෙන් කෙත් ඇල කණ්ඩායම සමන්විත වේ.

## 62 කෙත් ඇල නියෝජිත

සෑම කෙත් ඇල කණ්ඩායමක් සඳහා ම එම කෙත් ඇල කණ්ඩායමේ කටයුතු මෙහෙය වීම සඳහා කෙත් ඇල නියෝජිතයෙකු තෝරා පත් කර ගත යුතුය

## 63 කෙත් ඇල නියෝජිත ගේ වගකීම්

631 තම කණ්ඩායම නියෝජනය කිරීම හා කණ්ඩායම වෙනුවෙන් පෙනී සිටීම

632 කෙත් ඇල පද්ධතිය මනාව පවත්වාගෙන යැමට සහාය වීම/ මග පෙන්වීම

633 කාර්යක්පම ජල කලමනාකරණය

634 බල ප්‍රදේශයේ නිෂ්පාදන ඵලදායිතාවය වැඩි කිරීම සඳහා සහාය දීම

## 64 කෙත් ඇල නියෝජිත ගේ කාර්යභාරය

641 සියළුම ගොවීන් වෙත වාරි ජලය සාධාරණව හා සමානුපාතිකව බෙදා දීම

642 කෙත් ඇල රැස්වීම් පැවැත්වීම හා කණ්ඩායමේ අදහස් ලබා ගැනීම

643 කෙත් ඇල හා නිර්මිත නඩත්තුව, ආරක්ෂාව හා සංරක්ෂණය

644 වාරි පද්ධතිය නඩත්තු කිරීම සඳහා පංගු ලැයිස්තුව සකස් කිරීම

645 බල ප්‍රදේශයේ වාරිමාර්ග රක්ෂිත ආරක්ෂා කිරීම/නඩත්තු කිරීම සඳහා කණ්ඩායම මෙහෙය වීම /පෙළඹ වීම

646 කණ්ඩායමේ යෝජනා හා අදහස් කාරක සභාවට ඉදිරිපත් කිරීම

647 කාරක සභා තීරණ දැනුම්දීම හා ක්‍රියාත්මක කිරීම

648 ගොවීන් අතර ඇතිවන ගැටුම්/ආරවුල් විසඳීම

649 කෘෂි මාර්ග නඩත්තු කිරීම

6410 වගා සැලැස්ම ක්‍රියාත්මක කිරීම

6411 කණ්ඩායමේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමට කටයුතු කිරීම

6412 කණ්ඩායමට අදාල තොරතුරු යාවත්කාලීන කිරීම

6413 සාමාජික /සංවර්ධන අරමුදල් ගෙවීමට ගොවීන් උනන්දු කිරීම/මග පෙන්වීම/යොමු කිරීම

6414 කණ්ඩායමේ සාමූහිකත්වය හා අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය කිරීම සඳහා වැඩ සටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම

6415 කණ්ඩායමේ සාමාජිකයින් අතර විශ්වාසය තහවුරු කිරීම

6416 අලෙවි /යෙදවුම් කටයුතු සඳහා සහාය වීම

6417 ගොවි සංවිධානය විසින් පැවරූ වගකීම් භාර ගෙන ඉටු කිරීම

## 65 <u>කෙත් ඇල නියෝජිත නිල කාලය</u>

කෙත් ඇල නියෝජිතයෙකුගේ නිල කාලය වසර 2 කි. එහෙත් එක් අයෙකුට අඛණ්ඩව වාර 5 කට වඩා කෙත් ඇල නියෝජිතයෙකු ලෙස පත් විය නොහැක. එසේ වුව ද කණ්ඩායමේ සියළුම සාමාජිකයින් එකග වන්නේ නම් මෙම වාර ගනනේ සීමාවක් නොමැත.

## 66 <u>කෙත් ඇල නියෝජිත තෝරා පත් කර ගැනීම</u>

නිලවරණ මහා සභා රැස්වීමේ දී හෝ කෙත් ඇල කණ්ඩායමේ විශේෂ රැස්වීමක දී කෙත් ඇල නියෝජිත තෝරා පත් කර ගත යුතුය. ඒ සඳහා අවම වශයෙන් අදාල කෙත් ඇල කණ්ඩායමේ සාමාජිකයින්ගෙන් 35% ට වඩා සහභාගී විය යුතුය. අවම ගණපූර්ණය නොමැති අවස්ථාවක දී දින 14 ක් ඇතුලත නැවත කෙත් ඇල කණ්ඩායමේ රැස්වීමක් කැඳවා පැමිණ සිටින අයගේ වැඩි කැමැත්ත මත කෙත් ඇල නියෝජිත තෝරා ගත යුතුය. නිලවරණ මහා සභාවෙන් කෙත් ඇල නියෝජිතයින් තෝරා ගන්නා විට දී එක් එක් කෙත් ඇල කණ්ඩායම වෙන වෙනම ගෙන නියෝජිතයින් තෝරා ගත යුතු අතර ප්‍රමාණවත් ගණපූර්ණයක් ඇතිව 50% කට වඩා කෙත් ඇල කණ්ඩායම්වල නියෝජිතයින් තෝරා ගැනීමට නොහැකි වන අවස්ථාවක දී එම නිලවරණ මහා සභාවෙන් නිලධාරී මණ්ඩලය තෝරා නොගත යුතුය.

## 67 කෙත් ඇල නියෝජිත තනතුර සඳහා සපුරාළිය යුතු සුදුසුකම්

කෙත් ඇල නියෝජිත තනතුර සඳහා පත්වීමට පහත සුදුසුකම් සියල්ල සපුරාලිය යුතුය

671 පූර්ණ සාමාජිකයෙකු වීම

672 කෙත් ඇල කණ්ඩායම් බල ප්‍රදේශයේ වගා කටයුතුවල නිරත ඉඩම් හිමි වගා කරුවෙකු හෝ වගා කටයුතුවල නිරත ඔවුන්ගේ දූ දරුවෙකු වීම

673 ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා වසරක්වත් ගත වී තිබීම

674 ලිවීමේ කියවීමේ හැකියාව තිබීම

675 ගොවි සංවිධානයට ගෙවිය යුතු සාමාජික ගාස්තු හා සංවර්ධන අරමුදල් නොකඩවා ගෙවා තිබීම

676 තම කණ්ඩායම වෙනුවෙන් කැප වීමෙන් වැඩ කිරීමට කැමැත්ත දක්වන්නෙකු වීම

## <u>68 කෙත් ඇල නියෝජිත තනතුර සඳහා පත් වීමට නුසුදුසුකම</u>

681 රජයේ සේවකයෙක් වීම

682 පූර්ණ සාමාජිකයෙකු නො වීම

683 ප්‍රාදේශීය සභා, නගර සභා, පළාත් සභා, පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයක් දැරීම

684 ආශ්‍රිත සාමාජිකයෙකු වීම

685 සාමාජිකත්වය ලබා වසරක් ගත වී නො තිබීම

686 ලිවීමේ කියවීමේ හැකියාව නො තිබීම
687 ගොවි සංවිධානයට ගෙවිය යුතු සාමාජික ගාස්තු හා අනිකුත් සියU ගෙවීම් ගෙවා නො තිබීම
688 බල ප්‍රදේශයේ පදිංචි වගා කරුවෙකු නො වීම
689 ඉඩම් හිමි වගා කරුවෙකු හෝ ඔවුන්ගේ වගා කටයුතු වල නිරත දූ දරුවෙකු නො වීම

**69 කෙත් ඇල නියෝජිත ධූරයෙන් ඉවත් කිරීම**

691 කෙත් ඇල කණ්ඩායමේ බහුතර කැමැත්ත මත
692 විධිමත් දැනුම් දීමකින් තොරව පිටපිට වාර තුනකට වඩා කාරක සහා රැස්වීමට සහභාගී නො වීම
693 මහජන නියෝජිතයෙකු වීම
694 කෙත් ඇල කණ්ඩායම විසින් කෙත් ඇල නියෝජිතයෙකු ඉවත් කල විට ඔහුගේ කෙත් ඇල නියෝජිත ධූරය ද අහෝසි වන අතර ඔහු ගොවි සංවිධානයේ යම් තිලයක් දරණ ලද්දේ නම් ඊලගට පැවැත්වෙන මහා සහා රැස්වීම දක්වා ඔහුට එම ධූරයේ කටයුතු කළ හැක. එසේ වුව ද කෙත් ඇල නියෝජිතඉල්ලා අස් වූ අවස්ථාවක දී එම ඉල්ලා අස්වීම ත් සමග කෙත් ඇල නියෝජිත ධූරය මෙන්ම ගොවි සංවිධානයේ දරණ ලද තනතුර ද අහෝසි වේ.

**610 කෙත් ඇල නියෝජිත පුරප්පාඩු පිරවීම**

කෙත් ඇල නියෝජිතයෙක් ඉල්ලා අස් වුවහොත් හෝ ඉවත් කළ හොත් වහාම ඔහුගේ ඉතිරි සේවා කාලය සඳහා කෙත් ඇල නියෝජිතයින් තෝරාපත් කර ගැනීමේ ක්‍රම වේදය අනුව වෙනත් අයෙකු කෙත් ඇල කණ්ඩායම විසින් තෝරා පත් කර ගත යුතුය.

**611 කෙත් ඇල කණ්ඩායම් රැස්වීම් පැවැත්වීම**

වගා කන්නයක් තුළ අවම වශයෙන් මසකට එක් වතාවක් වත් කෙත් ඇල කණ්ඩායම රැස්විය යුතුය.

**07. විෂය කමිටු පත් කිරීම**

71 ඉහත 51 වගන්තිය යටතේ සඳහන් සුදුසුකම් මත පූර්ණ සාමාජිකත්වය ලබා ගෙන ඇති පහත සඳහන් කාර්යයන් හී නිරත සාමාජිකයන්ගෙන් පහත සඳහන් විෂය කමිටු පත් කළ හැක.

1. ධීවර විෂයකමිටුව
2. සත්ව පාලන විෂය කමිටුව
3. ගොඩ ඉඩම් වගා කරුවන්ගේ විෂය කමිටුව

එසේ වුව ද නියමිත ගණපූර්ණය සහිත ගොවි සංවිධාන මහා සහා රැස්වීම්වල යෝජනා සම්මතයක් මගින් අවශ්‍යතාව පරිදි මෙම විෂය කමිටු සංඛ්‍යාව වැඩි කර ගත හැක.

ඉහත එක් විෂය කමිටුවක් පත් කිරීම සඳහා අවම වශයෙන් එම කාර්යයයේ නිරත පුද්ගලයින් 25 කට වඩා සිටිය යුතුය.

**72 විෂය කමිටු නියෝජිත ලෙස පත් වීම සඳහා සපුරා ලිය යුතු සුදුසුකම්**

විෂය කමිටු නියෝජිත තනතුර සඳහා පත්වීමට පහත සුදුසුකම් සියල්ල සපුරාලිය යුතුය
721 පූර්ණ සාමාජිකයෙකු වීම
722 සාමාජිකත්වය ලබා වසරකට වඩා වැඩි කාලයක් ගත වී තිබීම
723 අදාල කාර්යයේ (ධීවර/සත්ව පාලන/ගොඩ ඉඩම් වගාව) පුද්ගලිකව නිරත වී සිටීම

**73 විෂය කමිටු නියෝජිත ලෙස පත් වීම සඳහා නුසුදුසුකම්**

731 රජයේ සේවකයෙක් වීම
732 පූර්ණ සාමාජිකයෙකු නො වීම
733 ප්‍රාදේශිය සභා, නගර සභා, පළාත් සභා, පාර්ලිමේන්තු මන්ත්‍රී ධූරයක් දැරීම
734 ආශ්‍රිත සාමාජිකයෙකු වීම
735 සාමාජිකත්වය ලබා වසරක් ගත වි නො තිබීම
736 ලිවීමේ කියවීමේ හැකියාව නො තිබීම
737 ගොවි සංවිධානයට ගෙවිය යුතු සාමාජික ගාස්තු හා අනිකුත් සියU ගෙවීම් ගෙවා නො තිබීම

## 74 විෂය කමිටු නියෝජිත පත් කිරීම

සෑම විෂය කමිටුවක් සඳහා ම වසර දෙකක කාලයක් සඳහා විෂය කමිටු සාමාජිකයින්ගේ වැඩි දෙනාගේ කැමැත්ත මත විෂය කමිටු නියෝජිතයෙකු පත් කළ යුතුය. සෑම විටම මෙම නියෝජිතයා පත් කළ යුත්තේ ගොවි සංවිධාන නිලවරණ මහා සභාවේ දී, විෂය කමිටු සාමාජිකයින්ගෙන් හෝ ඒ ආසන්නයේ පවත්වනු ලබන විෂය කමිටු රැස්වීමක දීය .

## 75 විෂය කමිටු නියෝජිත ඉවත් කිරීම

751 සාමාජිකයින් බහුතරයකගේ කැමැත්ත මත
752 මන්ත්‍රී වරයෙකු වීම(ප්‍රදේශීය සභා/නගර සභා/පළාත් සභා/පාර්ලිමේන්තු )
752 විධිමත් දැනුම් දීමකින් තොර ව අඛණ්ඩව වාර 3 ට වඩා වැඩි කාලයක් කාරක සභා රැස්වීම්වලට සහභාගී නො වීම

## 76 විෂය කමිටු නියෝජිත පුරප්පාඩු පිරවීම

ඉල්ලා අස්වීමක් නිසා හෝ ඉවත් කිරීමක් නිසා සිදුවන විෂය කමිටු නියෝජිත ධුරයේ පුරප්පාඩු විෂය කමිටු රැස්වීමක් කැඳවා වහාම පිරවිය යුතු අතර එම විෂය කමිටු නියෝජිතයාගේ සේවා කාලය ඉවත් කරන ලද හෝ ඉල්ලා අස්වන ලද විෂය කමිටු නියෝජිතගේ ඉතිරි සේවා කාලය පමණක් වේ. විෂය කමිටු නියෝජිතයෙකු ගේ ඉල්ලා අස් වීමක දී ඔහු විසින් ඒ බව ගොවි සංවිධාන ලේකම්වරයා ට ලිඛිතව දැනුම් දිය යුතු අතර විෂය කමිටු නියෝජිතයෙකු ඉවත් කිරීමේ දී අදාල විෂය කමිටුව ඒ බව ලිඛිතව ගොවි සංවිධානයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

## 77 විෂය කමිටු නියෝජිතගේ වගකීම් හා කාර්ය භාරය

771 විෂය කණ්ඩායමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කණ්ඩායම මෙහෙය වීම හා නායකත්වය ලබා දීම
772 කණ්ඩායම වෙනුවෙන් පෙනී සිටීම
773 කණ්ඩායමේ හැකියා වර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම

## 78 විෂය කමිටු රැස්වීම්

සෑම මසකට වරක් විෂය කමිටු රැස්වීමක් පැවැත්විය යුතු අතර ඒ සඳහා ගණපූරණය සාමාජික සංඛ්‍යාවෙන් 40% වේ.

## 08 බෙදුම් ඇළ ගොවි සංවිධාන කාරක සභාව

පහත සඳහන් අයගෙන් ගොවි සංවිධාන කාරක සභාව සමන්විත වේ.

(1) අතුරු ව්‍යවස්ථාවේ අංක 62 යටතේ තේරී පත් වන කෙත් ඇළ නියෝජිතයින්
(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ අංක 7 යටතේ පත්වන විෂය කමිටු නියෝජිතයින්
(3) ඉහත 2 වගන්තිය යටතේ කාරක සභාව ට නියෝජිතයෙකු තේරී පත් වීමට සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් එක් කණ්ඩායම කට අයත් පුද්ගලයින් 20 කට වඩා ගොවි සංවිධානයේ සාමාජිකත්වය ලබා තිබිය යුතුය. එමෙන්ම ඉහත 2 හා 3 යටතේ පත්වන නියෝජිතයින්ට සංවිධානයේ නිලයක් දැරීමට නො හැක. නමුත් කාරක සභා රැස්වීමේ දී යම් කරුණක් සම්බන්ධයෙන් ඡන්ද විමසීමක දී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ඇත.

## 81 බෙදුම් ඇළ ගොවි සංවිධාන කාරක සභාවේ බලතල හා කාර්යයන්

(1) සංවිධානයේ අභිවෘද්ධිය සඳහා අවශ්‍ය නීති රීති රෙගුලාසි සැකසීම, මහා සභවේ දී ඒවා අනුමත කර ගැනීම සහ ක්‍රියාත්මක කිරීම
(2) මහා සභාවේ තීරණය පරිදි අරමුදල් එකතු කිරීම සහ සංවිධානය තුළ මනා මූල්‍ය කළමනාකරණයක් පවත්වාගෙන යෑම
(3) මහා සභාවේ අනුමැතියට යටත්ව සාමාජිකයින් ඇතුලත් කර ගැනීම
(4) වාරිමාර්ග ආඥා පනත සහ ගොවි ජන සංවර්ධන පනත මගින් ගොවි සංවිධානය වෙත පැවරී ඇති නීතිමය බල තල ක්‍රියාත්මක කිරීම

(5) සංවිධානයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වැඩ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
(6) සංවිධානයේ කටයුතු කාර්යක්ෂම ලෙස මෙහෙයවීම සඳහා අවශ්‍ය කාර්ය පටිපාටි සැකසීම සහ ක්‍රියාත්මක කිරීම
(7) සංවිධානය වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීම
(8) ගොවි සංවිධානයේ අභිවෘද්ධිය සඳහා විවිධ අනු කමිටු පත් කිරීම සහ ඒවා මගින් හඳුන්වා දෙන සුදුසු යෝජනා ක්‍රියාත්මක කිරීම
(9) සංවිධානයේ අවශ්‍යතාවය මත කාර්ය මණ්ඩල බඳවා ගැනීම සහ ඉවත් කිරීම
(10) සාමාජික ලේඛනය නිසි පරිදි පවත්වාගෙන යෑම
(11) බල ප්‍රදේශයේ කෘෂිකාර්මික සැලැස්ම සැකසීම සඳහා සහාය දීම සහ ක්‍රියාත්මක කිරීම
(12) සංවිධානය සතු වත්කම් සහ දේපළ ආරක්ෂා කිරීම
(13) වත්කම් සහ දේපළ මිලදී ගැනීම සහ අවශ්‍ය අවස්ථාවල දී ඒවා උගසට හෝ බද්ධට තැබීම
(14) ගොවීන් අතර ඇතිවන ආරාවුල් විසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
(15) ජලය කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා අවශ්‍ය ක්‍රම හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම
(16) බල ප්‍රදේශයේ වාරි පද්ධතියේ නඩත්තු කටයුතු ඉටු කිරීම සහ වාරි පද්ධතියේ ආරක්ෂාව සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
(17) වාරි පද්ධතියේ කෙරෙන ඉදිකිරීම් සහ වෙනත් වැඩි දියුණු කිරීම් පිළිබඳ සුපරික්ෂාකාරීව සිටීම |
(18) සංවිධානයේ නිලධාරීන් සහ සාමාජිකයින්ගේ දැනුම, කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
(19) බල ප්‍රදේශයේ පවතින සම්පත් පිළිබඳ තොරතුරු එකතු කිරීම හා ඒවා අදාල ආයතන වෙත ලබා දීම
(20) මසකට වරක් කාරක සභා රැස්වීම් පැවැත්වීම
(21) නියමිත කාලය තුළ නිලවරණ මහා සභා රැස්වීම් හා අතිකූත් මහා සභා රැස්වීම් පැවැත්වීම
(22) මහා සභාව විසින් පවරන කටයුතු ඉටු කිරීම
(23) කාර්ය පරිපාටි වල සඳහන් පරිදි සංවිධානයේ ගිණුම් සහ පරිපාලන කටයුතු පවත්වාගෙන යෑම

## 82 බෙදුම් ඇළ ගොවි සංවිධාන කාරක සභා රැස්වීම්

සෑම මසකටම වරක් කාරක සභා රැස්වීම් පැවැත්විය යුතු අතර රැස්වීමේ ගණපූර්ණය ඡන්ද බලය හිමි සාමාජික සංඛ්‍යාවෙන් 50 % කට වඩා වැඩිවිය යුතුය. කාරක සභා රැස්වීම පැවැත්වීමේ දී කාර්ය පටිපාටි වල සඳහන් පරිදි කටයුතු කළ යුතුවේ

## 83 බෙදුම් ඇළ ගොවි සංවිධානයේ නිලධාරී මණ්ඩලය

නිලවරණ මහා සභා රැස්වීමේ දී මහා සභාව විසින් කෙත් ඇළ නියෝජිතයින් අතරින් තෝරා ගනු ලබන පහත සඳහන් නිලධාරීන්ගෙන් ගොවි සංවිධාන නිලධාරී මණ්ඩලය සමන්විතය

- ❖ සභාපති
- ❖ ලේකම්
- ❖ භාණ්ඩාගාරික
- ❖ උප සභාපති
- ❖ උප ලේකම්

ගොවි සංවිධානයේ ක්‍රමවේද සහ කාර්ය පරිපාටිවල සඳහන් ආකාරයට නිලධාරී මණ්ඩලය තෝරා ගත යුතුය

## 84 බෙදුම් ඇළ ගොවි සංවිධාන නිලධාරී මණ්ඩලයේ නිල කාලය

841 බෙදුම් ඇළ ගොවි සංවිධානයේ නිලධාරී මණ්ඩලයේ නිල කාලය වසර 2 කි.

842 අඛණ්ඩව වාර 5 කට වඩා එක් අයෙකුට ගොවි සංවිධානයේ එක් තනතුරක් දැරීමට නො හැක. මහා සභා සාමාජිකයින්ගෙන් 75% කට වඩා කැමති වන්නේ නම් මෙම සීමාව අදාල නොවේ. එසේ වුව ද පිට පිට වාර 8 කට වඩා එක් පුද්ගලයෙකුට ගොවි සංවිධානයේ එක් නිලයක් දැරීමට නොහැක.

## 85 බෙදුම් ඇල ගොවි සංවිධාන නිලධාරීන් ඉවත් කිරීම

851 බෙදුම් ඇල ගොවි සංවිධානයේ සාමාජිකත්වය අහෝසි වීම හෝ සාමාජිකත්වයෙන් නෙරපීම
852 මෙම අතුරු ව්‍යවස්ථාව හෝ අනුමත කාර්ය පරිපාටිය ට අනුව පත් කරනු ලැබූ විනය මන්ඩලයකින් වරද කරුවෙකු බව ඔප්පු වීම
853 සිහි විකල් භාවයට පත් වී ඇති බව ඔප්පු වීම
854 නියමිත ගණපූර්ණය සහිත විශේෂ මහා සභා රැස්වීමක දී සාමාජිකයින්ගෙන් 65% ක යෝජනා සම්මතයකින් ඉවත් කිරීම
854 කෙත් ඇල නියෝජිත ධුරයෙන් ඉවත් කිරීම හෝ ඉල්ලා අස් වීම

## 86 බෙදුම් ඇල ගොවි සංවිධාන නිලධාරී පුරප්පාඩු පිරවීම

861. ඉල්ලා අස්වීම නිසා ඇති වන පුරප්පාඩු සඳහා මහා සභා රැස්වීමේ අනුමැතියට යටත්ව, කාරක සභාව විසින් එක් අයෙකු තාවකාලික ව තෝරා පත් කර ගත යුතුය. මෙම පුරප්පාඩුව ඇති වීමෙන් පසු, පැවැත්වෙන පළමු මහා සභා රැස්වීමේ දී, මෙම පත් කිරීම සම්බන්ධයෙන් මහා සභාවේ අනුමැතිය ලබා ගත යුතුය. කෙත් ඇල කණ්ඩායම විසින් ගොවි සංවිධානයේ නිලයක් දරණ කෙත් ඇල නියෝජිතයෙකු ඉවත් කරනු ලැබූ අවස්ථාවේ සිට ඊලගට පවත්වනු ලබන පළමු මහා සභාව දක්වා ඉවත් කරනු ලැබූ නිලධාරියාට තම නිලයේ කටයුතු කළ හැකි අතර එම මහා සභා රැස්වීමේ දී ඔහු ඉල්ලා අස් විය යුතුය.

862. පුරපුපාඩු පිරවීමේ දී අලුතින් පත්වන නිලධාරියාගේ නිල කාලය වන්නේ එම තනතුරට අදාල නිල කාලයෙන් ඉතිරි කාලයයි.

## 87 ගොවි සංවිධාන නිලධාරී මණ්ඩලයේ වගකීම් හා කාර්ය භාරය

### 871 ගරු සභාපතිගේ වගකීම්

- ගොවි සංවිධානය විධිමත්ව හා අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා නායකත්වය දීම
- සංවිධානයේ සියළු කටයුතු විනිවිධ භාවයෙන් හා යහ පාලනයකින් යුක්තව පවත්වා ගෙන යාමට වගබලා ගැනීම
- ගොවි සංවිධානයේ ව්‍යවස්ථා හා කාර්ය පරිපාටි වලට අනුකූලව කටයුතු මෙහෙය වීම
- සංවිධානය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම
- ගොවි සංවිධානයේ කීර්ති නාමය ආරක්ෂා කිරීම
- ගොවි සංවිධානයේ රැස්වීම් වල විනය ආරක්ෂා කිරීම
- කාරක සභාව / මහා සභාව පනවා ඇති සීමාවන්ට යටත්ව සංවිධානය වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීම

### ගරු සභාපතිගේ කාර්ය භාරය

- ගොවි සංවිධානයේ දැක්ම මෙහෙවර සහ අරමුණු ලගා කර ගැනීම සඳහා සැළසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම ,මෙහෙයවීම හා ඇගයීම
- රැස්වීම්වල මූලාසනය දැරීම සහ රැස්වීම් කටයුතු මෙහෙයවීමේ දී සියළු දෙනාගේ ම දායකත්වය ලබා ගැනීම
- සංවිධානය නියෝජනය කරමින් රැස්වීම් වලට සහභාගී වීම
- සංවිධානයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා කාරක සභාව සමග එකතු වී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
- සංවිධානය විසින් පත් කර ඇති සේවකයින් පිලිබඳ අධීක්ෂණය
- නියමිත කාලයට නිලවරණ රැස්වීම්/ මහා සභා රැස්වීම්/ කාරක සභා රැස්වීම් පැවැත්වීම

## 872. ගරු ලේකම්ගේ වකීම්

- සාමාජික නාම ලේඛනය පවත්වා ගෙන යෑම හා යථාවත්කාලීන කිරීම
- මහා සභා/කාරක සභා රැස්වීම් තීරණ අදාල පාර්ශව වෙත අප්‍රමාදව යොමු කිරීම
- සංවිධානය වෙනුවෙන් සියළුම ලිපි ලේඛන වලට අත්සන් කිරීම
- සංවිධානයට ලැබෙන ලිපි භාර ගැනීම හා ඒවා මහා සභාවට/කාරක සභාවට දැනුම් දීම
- මහා සභා/කාරක සභා වලට අදාල සියළුම වාර්තා විදිමත් පරිදි පවත්වා ගෙන යාම
- අදාල රැස්වීමට නියමිත වාර්තා ඉදිරිපත් කිරීම
- සංවිධානය මගින් එළඹෙන ලද තීරණ ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම

### ගරු ලේකම් ගේ කාර්ය භාරය

- ගොවි සංවිධානයට ලැබෙන සියළුම ලිපි පිළිබඳව ක්‍රියා මාර්ග ගැනීම/පිළිතුරු සැපයීම
- ව්‍යවස්ථානුකූලව සියළුම රැස්වීම් (මහා සභා /කාරක සභා ) කැඳවීම හා පැමිණීමේ ලේඛන හා වාර්තා විදිමත් පරිදි පවත්වා ගෙන යෑම
- සිළුම රැස්වීම් වල න්‍යාය පත්‍රය සැකසීම
- සංවිධානයේ ලිපිගොණු විධිමත්ව පවත්වාගෙන යෑම
- සංවිධානයේ සියළුම දත්ත හා තොරතුරු රැස් කිරීම
- ගොවි සංවිධානය නියෝජනය කරමින් රැස්වීම්වලට සහභාගි වීම
- සංවිධානය වෙනුවෙන් අදාල තොරතුරු අනෙකුත් ආයතන වලට ලබා දීම
- සංවිධානයේ මුද්‍රාව හා අතිකුත් ශීර්ෂ පාඨ ආරක්ෂා සහිතව පවත්වාගෙන යෑම
- තිකුත් කර නොමැති සංවිධානය සතු ලදුපත් පොත් ආරක්ෂා සහිතව පවත්වාගෙන යෑම
- සංවිධානයේ වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම
- සංවත්සරික ප්‍රගති වාර්තාව සැකසීම හා සාමාජිකයින්ට ලබා දීම

## 873. ගරු භාණ්ඩාගාරිකගේ වගකීම්

- අතේ සහ බැංකුවේ ඇති මුදල් වලට වගකීම
- සංවිධානයේ සිදු වන සියළුම ගණුදෙනු වලට වගකීම

### ගරු භාණ්ඩාගාරිකගේ කාර්ය භාරය

- ලදුපත් ලියා මුදල් භාර ගැනීම
- වවුචර් මගින් මුදල් ගෙවීම් කිරීම
- මුදලින් සිදු නොවන ගණුදෙනු සඳහා අදාල කුවිතාන්සි තිකුත් කිරීම
- මුදල්පොත පිළියෙල කිරීම
- මාසික මුදල් ගණුදෙනු සාරාංශ පිළියෙල කිරීම/ඉදිරිපත් කිරීම
- ගණුදෙනු ජ'නලයේ සටහන් කිරීම
- පොදු ලෙජරය එදිනෙදා යාවත්කාලීන කිරීම
- අනුමත අත ඉතිරි මුදල් පමණක් තබා ගැනීම
- ලැබෙන මුදල් දින තුනක් ඇතුලත බැංකු ගත කිරීම
- අවශ්‍ය වූ විට බැංකුවෙන් මුදල් ආපසු ගැනීම
- සාමාජික මුදල් ලේඛනය පවත්වා ගැනීම
- සංවර්ධන අරමුදල් ලේඛනය පවත්වා ගැනීම
- තොග පොත පවත්වා ගැනීම
- ණය ලේඛනය පවත්වා ගැනීම
- තැන්පතු ලේඛනය පවත්වා ගැනීම
- ඉදිකිරීම් ලේඛන පවත්වා ගැනීම
- කම්කරු වැටුප් ලේඛනය පවත්වා ගැනීම
- මුදල් කළමනාකරණයට අදාල ලිපිගොණු පවත්වා ගැනීම
- අවසන් ගිණුම් සහ ශේෂ පත්‍රය පිළියෙල කිරීම

- ගණන් පරික්පකට ගිණුම් පරික්පාව ට ඉඩදීම /ඒ සදහා අවශ්‍ය තොරතුරු ලබා දීම
- බාහිර විගණනය කරවා ගැනීම
- විගණක වාර්තා මහා සභාවට ඉදිරිපත් කිරීම හා ඒවා ආරක්ෂිතව තමා භාරයේ තබා ගැනීම
- තමා භාරයේ තිබෙන සියළු පොත් පත් ලිපිලේඛන සහ වත්කම් විධිමත් ලෙස භාර දීම

**9. බෙදුම් ඇළ ගොවි සංවිධාන මහා සභාව**

සංවිධානයේ උපරිම බලය මහා සභාව සතුවේ. සංවිධානයේ සාමාජිකත්වය ලබා ගෙන ඇති සියළු දෙනාට ම මහා සභා රැස්වීම් වලට සහභාගී වීමට අයිතිය ඇත. එසේ වුව ද මහා සභා රැස්වීමේ දී ඉදිරිපත් වන යෝජනා සහ මතුවන කරුණු සම්බන්ධයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතිය ඇත්තේ මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ පූර්ණ සාමාජිකත්වය ලබා ඇති අයට පමණි. බෙදුම් ඇළ ගොවි සංවිධානයේ මහා සභා රැස්වීම් පැවැත්වීම සංවිධානයේ ක්‍රම වේද සහ කාර්ය පටිපාටි වලට අනුකූලව සිදු කළ යුතුය.

**91 මහා සභා රැස්වීම්**

සංවිධානයේ නිලධාරි මණ්ඩලය විසින් පහත සදහන් මහා සභා රැස්වීම් පැවැත්විය යුතුය.

1. අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම
2. නිලවරණ මහා සභා රැස්වීම
3. විශේෂ මහා සභා රැස්වීම

මහා සභාව දැනුම් දෙන කැදවීමේ ලිපියේ කැදවන මහා සභාවේ නම පැහැදිලිව සදහන් විය යුතුය.

**92 මහා සභා රැස්වීම් කැදවිය යුතු කාලය**

**921අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම**

සෑම වර්ෂයකම මාර්තු අප්‍රේල් අතර එක් මහා සභා රැස්වීමක් සහ අගෝස්තු සැප්තැම්බර් අතර එක් මහා සභා රැස්වීමක් වශයෙන් වසරකට අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම් දෙකක් කැදවිය යුතුය. එසේ වුව ද අවශ්‍යතාවය අනුව මෙම මහා සභා රැස්වීම් අවශ්‍ය ප්‍රමාණයක් කැදවිය හැකිය.

**922. නිලවරණ මහා සභා රැස්වීම**

සෑම වසර 2 කට වරක් නිලවරණ මහා සභා රැස්වීමක් කැදවිය යුතුය. එසේ වුව ද පළමු නිලවරණ මහා සභා රැස්වීම පවත්වා මාස 27 ක් ඇතුලත ඊලග නිලවරණ මහා සභාව කැදවිය යුතුය.

**923. විශේෂ මහා සභා රැස්වීම**

බෙදුම් ඇළ ගොවි සංවිධාන කාරක සභාවේ අවශ්‍යතාවය මත හෝ සාමාජිකයින්ගෙන් 1/3 කට වැඩි සංඛ්‍යාවක ලිඛිත ඉල්ලීම මත විශේෂ මහා සභාව කැදවිය යුතුය.

924යම් අවස්ථාවක නිලවරණ මහා සභා රැස්වීම සහ අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම එකම මාසයක යෙදී ඇති අවස්ථාවල දී අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්විය යුතු නො වන අතර අර්ධ වාර්ෂික මහා සභාවේ දී සාකච්ඡා කළ යුතු කරුණු ද නිලවරණ මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුලත් කළ යුතුය.

**93 මහා සභා රැස්වීම දැනුම් දීම**

**931අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම**

රැස්වීම පැවැත්වෙන දිනට දින 07 කට පෙර සියළු සාමාජිකයින් වෙත කෙත් ඇළ හා විෂය කමිටු නියෝජිතයින් මගින් වාචිකව හෝ ලිඛිතව දැනුම් දිය යුතුය. මේ හැරුණු විට ගොවි සංවිධානය විසින් තීරණය කර ඇති ප්‍රසිද්ධ ස්ථානවල දැන්වීම් ප්‍රදර්ශනය කිරීම මගින් සියළු සාමාජිකයින් දැනුවත් කළ යුතුය. ඉක්මන් හෝ හදිසි අවස්ථාවල දී මෙම සීමාව අදාළ නොවේ.

**932තිලවරණ මාහා සභා රැස්වීම**

රැස්වීමට දින 14 කට පෙර සියළු සාමාජිකයින්ට ලිඛිතව දැනුම් දිය යුතුය.

**933විශේෂ මහා සභා රැස්වීම**

රැස්වීම් දිනට දින 14 කට පෙර සියළු සාමාජිකයින්ට ලිඛිතව දැනුම් දිය යුතුය

**94 මහා සභා රැස්වීම් වල ගණපූර්ණය**

**941**. අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම්වල ගණපූර්ණය සංවිධානයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් 25% ක් වේ.
**942**. තිලවරණ මහා සභා රැස්වීම්වල ගණපූර්ණය සංවිධානයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් 35% ක් වේ.
**943**. විශේෂ මහා සභා රැස්වීම්වල ගණපූර්ණය සංවිධානයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් 35% ක් වේ.

**95 ගණපූර්ණය නොමැති නිසා කල් දමන ලද මහා සභා නැවත කැඳවීම**

951නියමිත සණපූර්ණය නොමැති වීම නිසා කල් තබන ලද අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම් එම කල් තබන ලද දින සිට දින 10 ක් ඇතුලත නැවත කැඳවිය යුතු අතර නියමිත සණපූර්නය නොමැති නිසා කල් තබන ලද තිලවරණ මහා සභා රැස්වීමක් කල් තබන ලද දින සිට දින 21 ක් ඇතුලත නැවත කැඳවිය යුතු වේ.

952සාමාජිකයින්ගේ ඉල්ලීම පරිදි කැඳවන ලද සණපූර්ණය නොමැති වීම නිසා කල් දමන ලද විශේෂ මහා සභා රැස්වීමක් නැවත කැඳවනු නො ලැබේ.

953 ගොවි සංවිධාන කාරක සභාවේ අවශ්‍යතාවය මත කැඳවා තිබූ විශේෂ මහා සභාවක් සණපූර්ණය නොමැති නිසා කල් දැමූ අවස්ථාවක දී එම කල් තබන ලද දින සිට දින 14 ක් ඇතුලත නැවත කැඳවිය යුතුය

**96 කල් තබන ලද මහා සභා රැස්වීම් නැවත දැනුම් දීම**

**961 අර්ධවාර්ෂික මහා සභා රැස්වීම්**

කල් තබන ලද දින මහා සභාවේ දී සහ ප්‍රදේශයේ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින්

**962 තිලවරණ මහා සභා රැස්වීම්**

සෑම පුද්ගලයෙකුට ම ලිඛිතව දැනුම් දිය යුතුය

**963 විශේෂ මහා සභා රැස්වීම්**

සෑම පුද්ගලයෙකුට ම ලිඛිතව දැනුම් දිය යුතුය

**97 කල් තබන ලද මහා සභා රැස්වීම් වල සණපූර්ණය**
කල් තබන ලද සියළුම වර්ගවල මහා සභා රැස්වීම් වල දී පැමිණ සිටින සාමාජිකයින්ගේ එකගතාවය මත පැමිණ සිටින සංඛ්‍යාව සණපූර්ණය සේ සළකා කටයුතු කල යුතුය.

**98 මහා සභා අඩාලව කල් තැබීම**

පැමිණ සිටින සාමාජිකයින්ගෙන් වැඩි දෙනාගේ ඉල්ලීම මත, ගිණුම් වාර්තා ඉදිරිපත් නො කිරීම හා රැස්වීමේ කටයුතු පාලනය කිරීමට නො හැකි වීම නිසා සභාපති වරයාට මහා සභාවේ කටයුතු අඩාලව කල් තැබිය හැක.

**99 අඩාලව කල් තබන ලද මහා සභා නැවත කැඳවීම**

අඩාලව කල් තබන ලද මහා සභාවක් දින 14 ක් ඇතුලත නැවත කැඳවිය යුතු අතර එහි දී සාකච්ජා කළ හැක්කේ පෙර මහා සභා න්‍යාය පත්‍රයේ ඇතුලත් ව තිබූ මහා සභාව කල් තබන අවස්ථාව වන විට සාකච්ජා නො කළ කරුණු පමණි. අඩාලව කල් තබන ලද මහා සභා රැස්වීමේ දීම එම මහා සභාව නැවත කැඳවන දිනය ස්ථානය සහ වේලාව

තීරණය කළ යුතු අතර ප්‍රසිද්ධ දැන්වීම් ප්‍රදර්ශනය මගින් එය ප්‍රසිද්ධ කළ යුතුය.

## 910 අඩාලව කල් තබන ලද මහා සභා රැස්වීම් වල ගණ පූර්ණය

සෑම වර්ගයකම මහා සභා රැස්වීමක් සඳහා ම නියමිත ගණපූර්ණය සහභාගී විය යුතුය

## 911 සාමාජිකයින් සතු ඡන්ද අයිතිය

මහා සභා රැස්වීමක දී යම් කරුණක් හෝ යම් යෝජනාවක් සම්බන්ධයෙන් ඡන්දය විමසීමක දී සෑම පූර්ණ සාමාජිකයෙකුට ම එක් ඡන්දයක් හිමි වන අතර ඡන්ද විමසීමක දී සෑම විටම රහස් ඡන්දයක් පැවැත්වීම ට කටයුතු කළ යුතුය. මහා සභාවේ යම් කරුණක් සම්බන්ධයෙන් (සභාව අඩාලව කල් තැබීමක දී හැර) ඡන්දය හිමි සාමාජිකයින්ගෙන් 10% කට නොඅඩු ප්‍රමාණයකට ඡන්ද විමසීමක් පවත්වන ලෙස ඉල්ලුම් කළ හැක. එවැනි අවස්ථාවක රහස් ඡන්දයක් පැවැත්විය යුතුය. යම් කිසි කරුණක් සම්බන්ධයෙන් පක්ෂව හෝ විපක්ෂව සමාන ඡන්ද ලැබුණු අවස්ථාවක ඒ සම්බන්ධයෙන් සභාපති වරයාට තීරක ඡන්දය හිමි වේ.

## 912 මහා සභා රැස්වීමේ මූලාසනය

මහා සභා රැස්වීමේ මූලාසනය සභාපතිවරයා දැරිය යුතු වන අතර ඔහු පැමිණ නැති නම් උප සභාපති මූලාසනය දැරිය යුතුය. මොවුන් දෙදෙනාම නොපැමිණි අවස්ථාවක දී මහා සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සාමාජිකයින් අතුරින් වෙනත් අයෙකු මූලාසනයට පත් කර ගත යුතුය.

## 913 මහා සභා රැස්වීමේ දී තීරණ ගැනීම

1. ලියා පදිංචි අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීමක දී සහ නිලධාරී මණ්ඩලය හෝ නිලධාරියෙකු නිලයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් නියමිත ගණපූර්නය ඇතුව එම රැස්වීමට පැමිණි සාමාජිකයින්ගෙන් 2/3 ගේ එකගතාවයෙන් සහා සම්මත විය යුතුය.
2. වෙනත් ඕනෑම කරුණක් හෝ යෝජනාවක් සම්බන්ධයෙන් ඉදිරිපත් වන යෝජනාවක් වන විට නියමිත ගණපූර්ණය ඇති රැස්වීමට පැමිනි සාමාජිකයින්ගෙන 50% කට වඩා වැඩි ප්‍රමාණයක එකගතාවයකින් සම්මත විය යුතුය.

## 914 මහා සභා රැස්වීම සඳහා සහාගී වීමට බලය ඇති අය

සංවිධානයේ ඕනෑම මහා සභා රැස්වීමක් සඳහා සහභාගී වීමට සහ එහි දී කතා කිරීමට පහත සඳහන් අයට බලය ඇත.

1. ගොවි ජන සංවර්ධන කොමසාරිස් ජෙනරාල් වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද පුද්ගලයෙකු
2. දිස්ත්‍රික් ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද පුද්ගලයෙකු
3. නේවාසික ව්‍යාපෘති කළමනාකරු හෝ ඔහු විසින් බලය පවරන ලද පුද්ගලයෙකු
4. සංවිධානයේ ගිණුම් පරීක්ෂණය කළ ගිණුම් පරීක්ෂක වරයා
5. ගොවි සංවිධානයේ නිලධාරී මණ්ඩලය මගින් කැඳවන ලද ඕනෑම පුද්ගලයෙකු

## 915 මහා සභාවේ බලතල

1. බෙදුම් ඇළ ගොවි සංවිධාන කාරක සභාව විසින් ඇතුලත් කර ගන්නා ලද අලුත් සාමාජිකයින්ගේ සාමාජිකත්වය පිළිගැනීම සහ ප්‍රතික්ෂේප කිරීම, සාධාරණ හේතු මත සාමාජිකත්වය ලබා ඇති ඕනෑම සාමාජිකයෙකු ගේ සාමාජිකත්වය තහනම් කිරීම අවලංගු කිරීම හා අහෝසි කිරීම
2. සාමාජිකත්වය තහනම් කිරීමේ කාලය දීර්ඝ කිරීම හෝ එම තහනම වලංගු කිරීම හෝ අවලංගු කිරීම
3. සංවිධානයේ නිලධාරී මණ්ඩලය කෙත් ඇළ නියෝජිතයින් අතුරින් තෝරා ගැනීම
4. බෙදුම් ඇළ ගොවි සංවිධාන කාරක සභිකයින්ගේ කාරක සභා ධුරය අහෝසි කිරීම හෝ තාවකාලිකව තහනම් කිරීම

5. බෙදුම් ඇල ගොවි සංවිධාන කාරක සභාව විසින් සංවිධානයට ඉදිරිපත් කරනු ලබන ඉදිරි වැඩ සහ යෝජනා සම්බන්ධයෙන් තීරණ ගැනීම
6. බෙදුම් ඇල ගොවි සංවිධාන කාරක සභිකයින්ගේ කටයුතු පරීක්ෂා කර බැලීම
7. සංවිධානයේ අභිවෘද්ධිය මත කාරක සභිකයින් අතුරින් සහ සාමාජිකයින් අතුරින් විවිධ කටයුතු සම්බන්ධයෙන් හා ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා අනු කමිටු පත් කිරීම සහ එම කටයුතු සම්බන්ධයෙන් යෝජනා අදහස් ලබා ගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ බලය කාරක සභාවට පැවරීම
8. සංවිධානය මගින් ලබා ගත හැකි ණය සීමා තීරණය කිරීම
9. සංවිධානය නමින් දේපළ හා වත්කම් ලබා ගැනීමට සහ ඒවා විකිණීම බද්දට දීම හෝ උගසට දීම සම්බන්ධයෙන් කාරක සභාවට අනුමැතිය ලබා දීම
10. අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කිරීම
11. බෙදුම් ඇල ගොවි සංවිධාන කාරක සභාව විසින් මුදල් පරිහරණය කරන ආකාරය සොයා බැලීම
12. බෙදුම් ඇල ගොවි සංවිධාන කාරක සභාව විසින් සකස් කරනු ලබන කාර්ය පටිපාටි අනුමත කිරීම
13. අතුරු ව්‍යවස්ථාවට අනුකූලව සංවිධානයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
14. විගණක වාර්තා සහ වෙනත් පරීක්ෂණ වාර්තා පිලිබඳ සලකා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
15. සාමාජික ගාස්තු තීරණය කිරීම
16. සංවිධානය නියෝජනය කිරීම සඳහා නියෝජිතයින් තෝරා පත් කර ගැනීම
17. සංවිධානයේ ආදායම් වියදම් ප්‍රකාශ සහා සම්මත කිරීම
18. සම්මතයට පත් විය නොහැකි, විසඳුමකට එළඹිය නොහැකි, නීති කඩවීම් සම්බන්ධයෙන් අධිකරන ක්‍රියාමාර්ග වලට යොමු වීම

## 10. විනය කමිටුව

විනය කරුණු සම්බන්ධයෙන් විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා මහා සභාව විසින් පහත සදහන් අය අතුරින් තිදෙනෙකු පත් කර ගත යුතුය

- ❖ නේවාසික ව්‍යාපෘති කළමනාකරු
- ❖ කාර්මික සහකාර
- ❖ ගොවි ජන සංවර්ධන නිලධාරි
- ❖ ග්‍රාම නිලධාරි
- ❖ ගොවි සංවිධාන සාමාජිකයින්

බෙදුම් ඇල ගොවි සංවිධාන කාරක සභාවේ ඉල්ලීම මත කිසියම් පුද්ගලයෙකුගේ විනය කඩ කිරීමක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග යෝජනා කිරීම මෙම කමිටුවේ වගකීම වේ.

## 11 බෙදුම් ඇල ගොවි සංවිධානයේ මූල්‍ය කටයුතු

111 ගොවි සංවිධානයේ කාර්ය පටිපාටි සංග්‍රහයේ සදහන් පරිදි ගිණුම් කටයුතු පවත්වාගෙන යා යුතු වේ.

112 සියලුම ලැබීම් සතියේ වැඩ කරන දින 03 ක් ඇතුලත බැංකු ගත කල යුතුය

113 බැංකුවෙන් මුදල් නිදහස් කර ගැනීම නේවාසික ව්‍යාපෘති කලමනාකරු හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධාරියෙකු ගේ නිර්දේශය මත සහ සභාපති හෝ ලේකම් යන දෙදෙනාගෙන් එක් අයෙකු සහ භාණ්ඩාගාරිකගේ අත්සන් මත සිදු කල යුතුය. බැංකු ගිණුමෙන් මුදල් නිදහස් කිරීමේ දී කාරක සභාව සමග සාකච්ඡා කර ඒ සඳහා අනුමැතිය ලබා ගත යුතු අතර එම කාරක සභා වාර්තාවේ පිටපතක් මුදල් නිදහස් කර ගැනීම සඳහා නේවාසික ව්‍යාපෘති කලමනාකරුගේ නිර්දේශය ලබා ගැනීමේ දී ඔහු වෙත ඉදිරිපත් කළ යුතුය. කාරක සභා රැස්වීමේ දී අනුමැතිය ලබා නො දුන් කරුණක් සම්බන්ධයෙන් මුදල් නිදහස්කිරීමේ නිර්දේශය ලබා දීමට නේවාසික ව්‍යාපෘති කලමනාකරුට බලය නොමැත.

114 භාණ්ඩාගාරික සතුව අත ඉතිරිය ලෙස රුපියල්.........................................ක් ලබා ගත හැකි අතර සංවිධානයේ කටයුතු අනුව අවස්ථානුකූල ව මෙම මුදල වැඩි කිරීමට කාරක සභාවට බලය ඇත.

## 12. විගණනය

121 සෑම ගොවි සංවිධානයක් ම පිලිගත් විගණකවරයෙකු ලවා වාර්ෂිකව තම ගිණුම් විගණනය කරවා ගත යුතුය

122 සෑම මුදල් වර්ෂයක් සඳහා මහා සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් විගණක කෙනෙක් පත් කර ගත යුතුය

123 එක් විගණකවරයෙකු අඛණ්ඩව වසර 5 කට වඩා පත් නොකල යුතුය

124 සෑම මුදල් වර්ෂයක් ම අවසන් වී මාස 6 ක් ඇතුළත විගනනය කරන ලද ගිණුම් වාර්තාවේ පිටපතක් සියලු සාමාජිකයින්ට ගොවි ජන සංවර්ධන කොමසාරිස් ජෙනරාල් වරයාට සහ නේවාසික ව්‍යාපෘති කළමනාකරුට ලබා දීමට බෙදුම් ඇල ගොවි සංවිධානය විසින් කටයුතු කළ යුතුය.

**13. මුදල් වර්ෂය**

බෙදුම් ඇල ගොවි සංවිධානයේ මුදල් වර්ෂය ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වන්නේ ය.

**14. ගිණුම් පරික්ෂාව**

සෑම මුදල් වර්ෂයක් සඳහා ම සංවිධානයේ ගිණුම් පරික්ෂාව සඳහා තිලවරණ මහා සභා රැස්වීමේ දී ගිණුම් පරික්ෂකවරයෙකු තෝරා පත් කළ යුතුය. ඔහු සංවිධානයේ සාමාජිකයෙකු වීමට හෝ නොවීමට පුලුවන. ඔහුට ගිණුම් කටයුතු පිළිබඳ දැනීමක් තිබිය යුතු අතර සෑම මසකම ගොවි සංවිධානයේ ගිණුම් පිළිබඳ පරික්ෂා කර බලා මුදල් කටයුතු පිළිබඳ වාර්තාවක් ගොවි සංවිධාන කාරක සභාවට ඉදිරිපත් කිරීම ඔහුගේ වගකීම වේ.

**15. අනුශාසක මණ්ඩලය**

පහත අයගෙන් අනුශාසක මණ්ඩලය සමන්විත වේ.

151 මහා සභාවෙන් පත් කරන සාමාජිකයින් දෙදෙනෙකු
152 සංවිධානයේ හිටපු සභාපති වරුන්
153 වාරිමාර්ග ඉංජිනේරු, ප්‍රාදේශීය ලේකම්, නේවාසික ව්‍යාපෘති කළමනාකරු

**16. අතුරු ව්‍යවස්ථාව සංශෝධනය**

161 නියමිත සණපූර්ණය ඇතුව පැවැත්වෙන විශේෂ මහා සභා රැස්වීමේ දී එම රැස්වීම සඳහා ඡන්දය දීමට හිමිකම ඇති සාමාජිකයින්ගෙන් 2/3 ගේ කැමැත්ත මත අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කළ හැක.

162 අතුරු ව්‍යවස්ථාවේ සංශෝධනය කිරීමට බලා පොරොත්තු වන කරුණු විශේෂ මහා සභා රැස්වීමේ කැඳවීම් ලිපිය සමග සෑම සාමාජිකයෙකුට ම ලබා දිය යුතු වේ.

163 සෑම අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් ම ගොවි ජන සංවර්ධන කොමසාරිස් ජෙනරාල්වරයා වෙත ලියා පදිංචිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

**17. බෙදුම් ඇල ගොවි සංවිධානය විසුරුවා හැරීම හෝ ඈවර කිරීම**

2000 අංක 46 දරණ ගොවි ජන සංවර්ධන පනතේ අංක 50 අනුව

**18. වචනාර්ථ**

181ගොවි සංවිධානය යනු ගොවි ජන සංවර්ධන පනතේ ලියා පදිංචි කරන ලද බෙදුම් ඇල ගොවි සංවිධානය වේ.

**182 "කෘෂිකර්මය "යන්නට**

(1) වී, කෙත් හෝග , කුළු බඩු , කාර්මික හෝග , එළවළු, පළතුරු, මල්, තණබිම් හෝ සත්ව ආහාර වගා කිරීම ;
(11) කිරි පට්ටි පාලනය ගොවිපළ සතුන් ඇති කිරීම ;
(111) පැළ සහ පළතුරු තවාන් ; සහ
(1V) මී මැසි පාලනය සහ මිරිදිය ධීවර කර්මාන්තය ඇතුළත් වේ ;

ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථාව 2002 ක් වූ .............................. මස..................දින.................................................................හී දී පැවති මහා සභා රැස්වීමේ දී අනුමත විය.

සාමාජිකයාගේ නම ලිපිනය අත්සන

1.........................................................................................

2.........................................................................................

3.........................................................................................

4.........................................................................................

5.........................................................................................

6.........................................................................................

7.........................................................................................

8.........................................................................................

9.........................................................................................

10.......................................................................................

11.......................................................................................

12.......................................................................................

13.......................................................................................

14.......................................................................................

15.......................................................................................

16.......................................................................................

17.......................................................................................

18.......................................................................................

**............................................මහා**

**වාරිමාර්ග බලප්‍රදේශයේ**

**.........................................ගොවි**

**සංවිධානයේ අතුරු ව්‍යවස්ථාව**